**Cambridge International Examinations**
Cambridge Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2018**

**1 hour 30 minutes**

INSERT

*9098836564-I*

**READ THESE INSTRUCTIONS FIRST**

This Insert contains the reading passage for use with the Question Paper.

You may annotate this Insert and use the blank spaces for planning.
This Insert is **not** assessed by the Examiner.



KI 142944/2
© UCLES 2018

CAMBRIDGE
International Examinations

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–11** on the Question Paper.

ශ්‍රී ලංකාවේ බොහෝ ගම්බද මිනිසුන්ට රැකියා නැත. සමහර වැඩිහිටියන් රැකියා බලාපොරොත්තු නොවන්නේ ඔවුන්ට කුඹුරු ගොවිතැන, හේන් ගොවිතැන හෝ සත්ව පාලනය වැනි ජීවන මාර්ග තිබෙන හෙයිනි. ලංකාවේ පිටිසර ගමක ජීවත් වන දීපාල් මෙසේ කියයිඃ 'මෙහේ බොහෝ මිනිස්සු මේ විදියට ජීවත් වෙති. ඒත් කිසියම් අධ්‍යාපනයක් ලැබූ තරුණ පිරිසට ඕනෑ නගරයකට ගොස් රැකියාවක් කිරීමටයි.'

බොහෝ ගම්වල පාසල් ඇතත් ඒවා නගරයේ පාසල්වලට වඩා වෙනස්ය. දීපාල් මෙසේ ද කියයිඃ 'ගම්බද පාසල්වල විද්‍යාගාර වැනි නූතන පහසු කම් නැත. සමහර ගම්වල පාසල්වල සෑහෙන තරම් පන්ති කාමර නැති නිසා එළිමහනේ ගස් යට ද ඉගැන්වීම කරනු ලැබේ. පහේ ශිෂ්‍යත්ව විභාගය සමත්වන ශිෂ්‍යයින් සුලු පිරිසකට පමණක් නගරයේ හොඳ පාසල්වලට ඇතුළු වීමට අවස්ථාව ලැබේ.'

බොහෝ ගම්වල පන්සල් ද තිබේ. දීපාල් මෙසේ කියයිඃ 'පන්සල ගමේ ජීවිතයට ඉතාමත් අවශ්‍යයි. මගේ ගමේ මිනිසුන් පන්සලට රැස්වන්නේ ආගමික කටයුතුවලට සහභාගි වීමට පමණක් නොවේ. එහි පැවැත්වෙන නැටුම් හා ජන නාට්‍ය බැලීමට ද ඔව්හු එහි යති. සමහර දිනවල ගමේ ශිල්පීන්ගේ ගායනා ද එහි පැවැත්වේ. දැන් මගේ ගමට විදුලිය ද තිබෙන හෙයින් මගේ බොහෝ අසල් වැසියන් රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර මිල දී ගෙන ඇත. දැන් අපට දිනපතා ජාතික පුවත්වලට සවන් දිය හැකිය. ඊටත් වඩා අප දැන් බාහිර ලෝකය හා සම්බන්ධ යැයි සිතේ.'

නාගරික සංස්කෘතිය ඉක්මණින් පැතිරයාමත් සමග සමහර ගැමියන් පරිගණක හා තොරතුරු තාක්ෂණික මෙවලම්ද මිල දී ගන්නට පටන්ගෙන ඇත. මේ වෙනස් කම් දීපාල් මෙසේ විස්තර කරයිඃ 'පාසල් විෂය මාලාවට තොරතුරු තාක්ෂණය හඳුන්වා දී තිබෙන හෙයින් බොහෝ ගම්බද පාසල්වල එම විෂයයන් ද උගන්වනු ලැබේ. ප්‍රවාහන පහසු කම් ඉක්මණින් වැඩි වී යාමත් සමග ගම හා නගරය අතර පෙර පැවති පරතරය ද දැන් අඩු වී යමින් තිබේ. දැන් ගමේ බොහෝ නිවෙස්වල කිසියම් ආකාරයක වාහනයක් ද දක්නට ඇත. පසුගිය දශක දෙක තුළ නාගරික සංස්කෘතිය පැතිරීමත් සමග ගමේ ආහාර, ඇඳුම් හා සිරිත්විරිත් වෙනස් වෙමින් පවතී. සමහර ගැමියන් පිස්සුවෙන් මෙන් නාගරික සංස්කෘතිය වෙත ඇදෙන අතර ගමේ ආහාර හා ඇඳුම් ආදිය වැළඳ ගැනීම වෙත ඇදී යන ප්‍රවණතාවක් නගරවල ද පවතී. ඒ නිසා නගරවල හා ප්‍රධාන පාරවල් දෙපස 'ගමේ කඩේ' 'පොල් අතු බත් කඩේ' 'ඇඹුල' වැනි නාම පුවරු දක්නට ඇත. මේ සිදුවන වෙනස්කම් පුදුම සහගතය.'

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge International Examinations Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cie.org.uk after the live examination series.

Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.